2018

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

වාර්ෂික වාර්තාව

අපගේ දර්ශනය

අප රට ආර්ථිකයෙහි සියලු අංශවලට අදාළව ප්‍රමිතිකරණය සහ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කාර්යයන් ඉටු කරමින් ජාතික ජීවන තත්ත්වය සුපෝෂණය කිරීම පිණිස නායකත්වය ලබා දෙන්නා වූ අග්‍රගණ්‍ය ජාතික සංවිධානය බවට පත්වීමය



මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ ආයතනයේ සේවාලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරන අතර ජාතික ආර්ථිකයෙහි සියලුම අංශවල ප්‍රමිතිකරණය, මිනුම්, තත්ත්ව ආරක්ෂණය සහ ආශ්‍රිත කාර්යයන් ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසු කිරීම තුළින්

- ඵලදායිතාව වැඩි කිරීම සහ සම්පත් පරිහරණය උපරිම කිරීම
- අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම පහසු කිරීම
- සමාජ ආර්ථික සංවර්ධනය ලභා කර ගැනීම
- භාණ්ඩ හා සේවාවන්ගේ අන්තර්ජාතික තරහකාරීත්වය වර්ධනය කිරීම සහ
- පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීමයි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන ඇමතිතුමා වෙත

ගරු ඇමතිතුමනි,

2018-01-01 දින සිට 2018-12-31 දින දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව එම ආයතනයෙහි මහා මණ්ඩලයේ සාමාජිකයින් වෙනුවෙන් 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කරමි.

මෙයට

ඔබගේ විශ්වාසී

අත්සන් කලේ
ආචාර්ය ඩබ්ලිව් එම් අබේරත්න බණ්ඩාර
සභාපති
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
2020-01-30

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

පටුන

	පිටු අංක
මහා මණ්ඩල සාමාජිකයන්	06
ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මඩුල්ල	07
හැඳින්වීම	08
2018 වර්ෂයේ වැදගත් සිදුවීම්	09
ආදායම් උපයන ක්‍රියාකාරකම්	11
ආයතනයේ ආංශික ක්‍රියාකාරකම්	12
විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය	12
ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය	15
තත්ත්ව ආරක්ෂණ අංශය	16
පද්ධති සහතිකකරණ අංශය	17
පුහුණු අංශය	20
අලෙවි හා ප්‍රවර්ධන අංශය	21
පරීක්ෂණාගාර සේවා අංශය	22
මිතිවිද්‍යා අංශය	29
ප්‍රලේඛන හා තොරතුරු අංශය	30
නිෂ්පාදිත සහතිකකරණ අංශය	31
පරිපාලන අංශය	33
තොරතුරු තාක්ෂණ ඒකකය	34
මුදල් අංශය	36
අභ්‍යන්තර විගණන	36
මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද විද්‍යාත්මක ප්‍රමිති ලැයිස්තුව	37
මහා මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉංජිනේරු ප්‍රමිති ලැයිස්තුව	50
විදේශීය පුහුණු	53
දේශීය පුහුණු	55
විදේශ විගණන	57
කාර්ය මණ්ඩල තොරතුරු	60
ආංශික කමිටු සංයුතිය	62
2018-12-31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ වාර්තාව	69
2018 දෙසැම්බර්31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	70
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තාව	105
විගණකාධිපතිතුමාගේ වාර්තාව	106
විගණකාධිපතිතුමාගේ වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ අදහස් දැක්වීම	113

ලිපිනය

නො, 17 වික්ටෝරියා පෙදෙස
ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකථනය: 2671567 - 72
2697039, 2674618
ටෙලිෆැක්ස්: 2687523, 2671579,
2672617, 2672616
විද්‍යුත් තැපෑල: slsi@slsi.lk
වෙබ් අඩවිය: http://www.slsi.lk



දුරකථන අංක

සභාපති	2671573
අධ්‍යක්ෂ ජනරාල්	2671574
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2671575
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	2697029

අංශය

විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය	2672614
ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය	2672612
තත්ත්ව ආරක්ෂණ අංශය	2671578
පරීක්ෂණාගාර සේවා අංශය	2694985
මිතිවිද්‍යා අංශය	2674619
පද්ධති සහතිකරණ අංශය	2672613
ප්‍රලේඛන හා තොරතුරු අංශය	2672615
පුහුණු අංශය	2685546
අලෙවි හා ප්‍රවර්ධන අංශය	2694981
පරිපාලන අංශය	2671576
මුදල් අංශය	2671577
නිෂ්පාදිත සහතිකකරණ අංශය	5626204



ආයතනික ව්‍යුහය


සභාපති
සහ
මහා මණ්ඩල
සාමාජිකයින්
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්
නියෝජ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ
විද්‍යාත්මක
ප්‍රමිතිකරණ
අධ්‍යක්ෂ
අලෙවි හා
ප්‍රවර්ධන
අධ්‍යක්ෂ
නිෂ්පාදිත
සහතිකකරණ
අධ්‍යක්ෂ
මිනි විද්‍යා
අධ්‍යක්ෂ
තත්ත්ව
ආරක්ෂණ
අධ්‍යක්ෂ
මුදල්
අධ්‍යක්ෂ
පරිපාලන
අධ්‍යක්ෂ
ඉංජිනේරු
ප්‍රමිති
අධ්‍යක්ෂ
ප්‍රලේඛණ හා
තොරතුරු
අධ්‍යක්ෂ
පුහුණු
අධ්‍යක්ෂ
පද්ධති
සහතිකකරණ
අධ්‍යක්ෂ
පරීක්ෂණාගාර
සේවා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තොරතුර තාක්ෂණ ඒකකය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
සහකාර/අධ්‍යක්ෂ නියෝජ්‍ය අධ්‍යක්ෂ
කණිෂ්ඨ කළමනාකරණ
සහකාර/අධ්‍යක්ෂ නියෝජ්‍ය අධ්‍යක්ෂ
කණිෂ්ඨ කළමනාකරණ
සහකාර කාර්යාලීය/තාක්ෂණීය නොවන
ප්‍රාථමික සේවා පුහුණු/අර්ධ පුහුණු නොපුහුණු

සභාපති තුමාගේ පණිවුඩය



2018 වාර්ෂික වාර්ථාව සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපති ලෙස මෙම පණිවුඩය ලබාදීමට හැකිවීම ගැන මම ඉතා සතුටු වේමි.

විවිධ ක්ෂේත්‍රයන්හි ජාතික ප්‍රමිතිවල මායිම් පුලුල් කිරීමේ මෙහෙවරට සමගාමීව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් රටට තවත් සේවාවන් සැපයීම සඳහා පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය රජයේ සහ පාරිභෝගිකයින්ගේ සහාය ඇතිව මේ වන විට අප රටේ යහපැවැත්ම සහ උනන්දුව අත්කර ගෙන ඇති බැවින් මේ සම්බන්ධව අප ආඩම්බර විය යුතුයි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි එවැනි කැප වූ කාර්ය මණ්ඩලයක් සමග වැඩ කිරීමට ලැබීම මට භාග්‍යයක් වන අතර ඔවුන්ගේ රාජකාරි කාර්යක්ෂම ඉටුකිරීම සඳහා කැපවීම සහ වසර පුරා අඛණ්ඩව සහයෝගය දැක්වීම පිළිබඳව මම ඔවුන්ට ස්තුතිවන්ත වෙමි.

අවසාන වශයෙන් නොව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඉහල තලයකට ගෙනයාමට අප දැරූ උත්සාහයට අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ මහා මණ්ඩලයේ සාමාජිකයින් ලබාදුන් සහයෝගයට සහ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් අපට අවුරුද්ද පුරා ලබාදුන් සියලු සහයෝගය වෙනුවෙන් මම ස්තුතිය පුද කරන්නෙමි.

අත්සන් කළේ
ජේ කසීම්, PC
සභාපති
ශ්‍රීලංප්‍රඅා



අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ පණිවුඩය

2018 වාර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රීලංප්‍රඅා) ප්‍රමිති සම්පාදනය තුළින් නිෂ්පාදිත සහතික කිරීම, පද්ධති සහතික කිරීම, පුහුණු කිරීම්, ක්‍රමාංකනය, තොරතුරු සේවාවන්, ආනයන පරීක්ෂාව හා පරීක්ෂණාගාර සේවා පරීක්ෂා වැනි රටේ සියලුම අංශවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට බලපාන සේවාවන් සැපයීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ අඛණ්ඩව විශාල කාර්‍යභාරයක් ඉටුකරයි.

අප රටේ යහපැවැත්ම උදෙසා රජය, කර්මාන්ත හා පාරිභෝගිකයින් සමග සහයෝගයෙන් ශ්‍රීලංප්‍රඅා මෙතෙක් සිදුකර ඇති සේවය අප ආඩම්භරයෙන් සිහිපත් කරන්නෙමු. ප්‍රමිතිවල වැදගත්කම සඵලදායී ලෙස ව්‍යාප්ත කිරීමෙන් නිෂ්පාදනවල ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා ශ්‍රීලංප්‍රඅා සිය උපරිම උත්සාහයන් යොදවනු ඇතැයි විශ්වාස කරමි.

ගරු අමාත්‍යතුමා, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්, සභාපති සහ මහා මණ්ඩල සාමාජිකයින්ට මාගේ අවංක ස්තුතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. අවසාන වශයෙන් මාගේ පූර්වගාමීන් සහ සමස්ත කළමනාකරණ කණ්ඩායම විසින් ලබා දුන් අනගි දායකත්වය සහ මාගේ කාර්ය මණ්ඩලය විසින් සැම මට්මටකින්ම දක්වන ලද කැපවීම පිළිබඳව මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

අත්සන් කළේ
ආචාර්ය සිද්ධිකා සේනාරත්න
අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
ව්‍යවස්ථාපිත තත්ත්වය	ලංකා ප්‍රමිති කාර්යංශය යනුවෙන් ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලය 1984 අංක 06 දරණ පනත මගින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය යන නාමය යටතේ ස්ථාපිත කරන ලදී.
ප්‍රධාන කාර්යාලය	No. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 8
දුරකථන	011-2671567-72, 2697039, 2674618
වෙබ් අඩවිය	http://www.slsi.lk
විද්‍යුත් තැපෑල	slsi@slsi.lk
ෆැක්ස්	011 – 2687523, 2671579, 2672617, 2672616

2018-12-31 දිනට මහා මණ්ඩලය		
	එච් එම් ම් සී හේරත් මයා	සභාපති
	ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය	අධ්‍යක්ෂ ජනරාල්/උප සභාපති
	මහාචාර්ය සී පී දීපාල් මැතිවු මයා	මහා මණ්ඩල සාමාජික
	ආචාර්ය පී තල්ගස්වත්ත මිය	මහා මණ්ඩල සාමාජික
	මහාචාර්ය ශ්‍රීමලී ප්‍රනාන්දු මිය	මහා මණ්ඩල සාමාජික
	ඉංජිනේරු කේ එස් එම් සිල්වා මයා	මහා මණ්ඩල සාමාජික
	රුවන් එදිරිසිංහ මයා	මහා මණ්ඩල සාමාජික
	සී ජේ කේ පෙරේරා මයා	මහා මණ්ඩල සාමාජික
	ඉන්දිකා රනතුංග මිය	මහා මණ්ඩල සාමාජික
	රොසානරා ද ක්රූස් මිය	මහා මණ්ඩල සාමාජික

2018-12-31 දිනට සම්පූර්ණ සේවක සංඛ්‍යාව 329

විගණකවරුන්	විගණකාධිපතිතුමා, විගණකාධිපති දෙපාර්තමේන්තුව අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල
බැංකුකරුවන්	ලංකා බැංකුව, අධිශ්‍රේණි ශාඛාව බොරැල්ල

මහා මණ්ඩල සමාජිකයින් -ශ්‍රී ලං ප්‍ර ආ

පී එන් එස් කේ ගුණවර්ධන මයා
සභාපති 2018-01-25 දක්වා
B.Sc (Eng.)
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION: 6.1(a) and 7(1)

උදය ආර් සෙනවිරත්න මයා
වැඩබලන සභාපති 2018-02-01 සිට 2018-03-04 දක්වා
ලේකම් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION: 6.1(a) and 7(1)

එච් එම් බී සී හේරත් මයා
වැඩබලන සභාපති 2018-03-05 සිට 2018-05-23 දක්වා
නැවත පත් කිරීම w.e.f. 2018-06-01 සිට
B.Sc.(Botany), India., M.Sc.(Forestry)
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION: 6.1(a) and 7(1)

ඩබ්ලියු නයනා එන් සතරසිංහ මිය
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් 2018-07-31 දක්වා
B.Sc, M.Sc, , Senior Member A.S.Q. Registered Lead Auditor for QMS IRCA UK, EMS Lead Auditor, EnMS Lead Auditor, OHSAS Lead Auditor, NQA Examiner
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION : 6.1(I) and 7(2)

ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක 2018-08-01 දින සිට
BSc-Chem. Sp. (Hons), PhD (UK)
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION : 6.1(I) and 7(2)

සුරේනි සන්දිකා දික්කුඹුර මිය
මහා මණ්ඩල සාමාජික 2018-01-30 දක්වා
Attorney-at-Law
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(a)

රුවන් ඒදිරිසිංහ මයා
මහා මණ්ඩල සාමාජික 2018-05-23 දක්වා
නැවත පත්කිරීම 2018-06-01
B.Sc. (Eng.)., PG Diploma in Construction Management
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(h)

මහාචාර්ය සී පී දිපාල් මැතිව්
මහා මණ්ඩල සාමාජික 2018-05-23 දක්වා
නැවත පත්කිරීම 2018-06-01 දක්වා
Diploma(Osaka), B.Sc.(Sp.), M.Sc. (Col), PhD (Bio. Cem).(Col)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION:6.1(g)

ඉංජිනේරු කේ එස් එම් සිල්වා
මහා මණ්ඩල සාමාජික 2018-05-23 දක්වා
නැවත පත්කිරීම 2018-06-01
B.Sc. Eng. (Hons), M.Eng (structural), C.Eng.,MIE (SL), MSSE (SL), DIPM(UK), Chartered Eng., Green Associated Professional –SLGBC
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(f)

මහාචාර්ය ශ්‍රීමලි ප්‍රනාන්දු
මහා මණ්ඩල සාමාජික upto 2018-05-23 **දක්වා**
නැවත පත්කිරීම 2018-06-01
MBBS (Col).,Dip Med Micro(Col)., M.Sc(Lond)., FNASSL
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1©

ආචාර්ය ප්‍රයදර්ශනි තල්ගස්වත්ත
මහා මණ්ඩල සාමාජික 2018-05-25 **දක්වා**
නැවත පත්කිරීම 2018-06-01
B.Sc., M.Sc.(Bio), M.Sc.(Mgt), Ph.D,
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(a)

සී ජේ කේ පෙරේරා මයා
මහා මණ්ඩල සාමාජික 2018-05-23 දක්වා
නැවත පත්කිරීම 2018-06-01
I.B.Com (Special), Chartered Accountancy Licentiate Certificate
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(b)

චන්ද්‍රිකා තිලකරත්න මිය
මහා මණ්ඩල සාමාජික 2018-05-01 **දක්වා**
B.Sc. (Special) (Agr.), M.Sc.(Mgt.)
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(e)

රොහාන් ජයතිලක මයා
මහා මණ්ඩල සාමාජික 2018-02-27 **දක්වා**
B.Sc.(Agr.), M.Sc.(Agr.), Master in International Development Studies, (Japan).,
APPOINTED IN TERMS OF SLSI ACT NO.6 OF 1984 SECTION: 6.1(d)

ඉන්දිකා රණතුංග මිය
මහා මණ්ඩල සාමාජික 2018-06-01 **දින සිට**
Master in International Business (Australia),
Master in Commerce (Australia),
Master of Economic University of Kalaniya,
PGD Public Management Project
PGD International Relations, Attorney-at-Law
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION: 6.1(d)

රොෂානර ද ක්රූස් මිය
මහා මණ්ඩල සාමාජික -2018-06-01 දින සිට
MBA, FCMA (UK), CGMA, Management Consultant
APPOINTED IN TERMS OF SLSI ACT NO. 6 OF 1984 SECTION: 6.1(a)

කළමනාකරණ මඩුල්ල - ශ්‍රී ලං ප්‍ර ආ

පී එන් එස් කේ ගුණවර්ධන මහතා
සභාපති 2018-02-01 දක්වා
B.Sc (Eng.)

උදය ආර් සෙවිරත්න මහතා
වැඩබලන සභාපති 2018-02-01 සිට 2018-03-04 දක්වා

එච් එම් බී සී හේරත් මහතා
වැඩබලන සභාපති 2018-03-05 සිට 2018-05-23 දක්වා
නැවත පත්කිරීම 2018-06-01
B.Sc.(Botany), India., M.Sc.(Forestry)

ඩබ්ලියු එන් එන් සතරසිංහ මිය
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් 2018-07-31 දක්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2018-08-27 දක්වා
B.Sc, M.Sc, , Senior Member A.S.Q. Registered Lead Auditor for QMS IRCA UK, EMS Lead Auditor, EnMS Lead Auditor, OHSAS Lead Auditor, NQA Examiner

ආචාර්ය සිද්ධිකා පී සේනාරත්න මිය
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක 2018-08-01 සිට
B Sc. Chem. Sp. (Hons), PhD (UK)

ඒ ඒකනායක මහතා
අධ්‍යක්ෂ (සුහුණු)
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2018-03-26 දක්වා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2018-03-27
B.Sc. (Sp), M.Sc. in Physics C Phys., MIP(SL), ISO 9000 Lead Auditor, NQA Examiner

සමන්ති නාරන්ගොඩ මහත්මිය
අධ්‍යක්ෂ (පද්ධති සහතිකකරණ)
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 2018-09-11
B.Eng., P G Dip in Mgt., MBA (Sri J-PIM), MIET (UK), QMS/EMS/OHSAS Auditor, NQA Examiner

එම් එස් එස් ප්‍රනාන්දු මයා
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
B.Sc (Eng.),MBA, AMIE(SL), QMS Lead Auditor (IRCA-UK)

කේ එම් සී බී සේනාරත්න මහතා
අධ්‍යක්ෂ (පරිපාලන) 2018-07-10 දක්වා
MDefS, B Sc (Mgt), EDBA, MISMM

බී ඩී ආරියරත්න මහතා අධ්‍යක්ෂ
(ප්‍රලේඛණ හා තොරතුරු)
B.Sc.(Special), M I P (SL)

එම් බී ඩී නීලකාන්ති මිය
අධ්‍යක්ෂ (තත්ත්ව ආරක්ෂණ)
B.Sc.(Special) Hons. M.Sc., MBA, QMS/EMS/En.MS/OHSAS Auditor,
Six Sigma (Green Belt) ASQ member

එල් පී එල් චිත්‍රගේ මහතා
අධ්‍යක්ෂ (පරීක්ෂණාගාර සේවා)
B.Sc (sp), M.Sc. C Phys, MIP (SL)

එස් උදාකර මෙනවිය
අධ්‍යක්ෂ (ඖකි විද්‍යා)
B.Sc (Sp),., M.Sc(Physics of Materials) M I P (SL),
ISO 17025 Technical Assessor, ISO9001
Auditor

එම් අයි එස් ජයසේකර මහත්මිය
අධ්‍යක්ෂ (විද්‍යාත්මක ප්‍රමිතිකරණ)
B.Sc. Special (Hons), M.Sc (Food Sc. & Tech)
Auditor : ISO 9001, QMS, ISO 22000 FSMS, HACCP, GMP

එච් ජී එස් සූරියආරච්චි මහත්මිය
අධ්‍යක්ෂ (නිෂ්පාදිත සහතිකකරණ)
B. Sc (Special), M. Sc. (Microbiology), ISO 22000, FSMS Auditor, HACCP Auditor, ISO14000 EMS Auditor, ISO17025 Lab Assessor

ආර් රුබසිංහ මෙනවිය
අධ්‍යක්ෂ (මුදල්) 2018-07-11 දක්වා
ACA (SL) & ACMA-UK

ටී සේනාරත්න මිය
අධ්‍යක්ෂ (අලෙවි හා ප්‍රවර්ධන)
MBS, B.Sc.(Chem.Special), QMS Lead Auditor (IRCA-UK)
Auditor for OHSAS & SA 8000, Examiner for NQA, Certified Member (SLIM)

ඩබ්ලිව් ජී එම් එස් පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය)
Licentiate Certificate
The Institute of Chartered Accounts of Sri Lanka

ඩීබී එම් රාජසිංහ
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ(මුදල්)
Attending to duties of D (F) w.e.f. 2018-07-11
Licentiate Certificate, The Institute of Chartered Accounts of Sri Lanka IPFDA

එම් එස් එම් අලියාර් මයා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
Attending to duties of Director (PC) w.e.f.2018-09-26
B.Sc. (Special), M.Sc., MIP (SL), SL NQA Examiner, ISO9001: QMS Auditor

ඒ ඒ පී ඩී පිගේරා මෙනවිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ
Attend to duties of Director (T) w.e. f 2018-02-06
B.Sc. (Gen) in Bio Science (Hons)
M.Sc. in Environmental Science

හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ශ්‍රීලංප්‍රඅා)1964 අංක 38 දරණ පනත යටතේ ලංකා ප්‍රමිති කාර්යාංශය ලෙස ස්ථාපිත කරන ලදී. 1984 අංක 6 දරණ පනත මගින් මෙම පනත අවලංගු කරන ලද අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට ප්‍රමිතිකරණය සහ තත්ත්ව කළමනාකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ මූලික වගකීම බලගන්වා ඇත

මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව ආයතනයට පහත සඳහන් ප්‍රධාන අරමුණු පවරා ඇත.

- ජාතික හා ජාත්‍යන්තර පදනමින් ප්‍රමිති සකස් කිරීම
- කර්මාන්ත සහ වාණිජ ක්ෂේත්‍රයන්හි ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම.
- ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය තවදුරටත් කරගෙනයාම සඳහා රසායනාගාර, පුස්තකාල සහ වෙනත් අදාළ පහසුකම් ඇති කිරීම
- නිෂ්පාදිත, වෙළෙඳ භාණ්ඩ සහ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම මෙන්ම දේශීයව නිපදවන නිෂ්පාදනල වෙළඳ භාණ්ඩ හා ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා භාවිතා කරන ක්‍රියාවලි සහ පිළිවෙත් පිරික්සීම.
- පරීක්ෂාවන් සිදුකිරීම සහ ක්‍රමාංකනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හෝ පහසුකම් සැපයීම සහ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව වෙනත් උපකරණ සැපයීම
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා පහසුකම් සැපයීම හා සැලසුම් කිරීම
- සහතික ලාංඡන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- වෙළෙඳ භාණ්ඩ, ද්‍රව්‍ය හා වෙනත් නිෂ්පාදනවල ගුණාත්මක භාවය සහතික කිරීම.
- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම.
- ආයතනයට සමගාමී අරමුණු තිබෙන ශ්‍රී ලංකාවෙන් පිටත ඕනෑම පුද්ගලයෙකු, සංගමයක් හෝ සංවිධානයක් සම සහයෝගයෙන් කටයුතු කිරීම.
- වෙළෙඳ භාණ්ඩ, ද්‍රව්‍ය සහ නිෂ්පාදන, ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින්ගේ උත්සාහයෙන් සම්බන්ධීකරණය කිරීම.

මානව සම්පත් හැදින්වීම

2018 වර්ෂය ආරම්භයේ දී මුළු සේවක සංඛ්‍යාව 341 ක් වූ අතර වර්ෂය අවසානයේදී 329 ක් විය.

ආයතනය විසින් කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමේදී සඵලදායී ලෙස දායක වීම සඳහා ඔවුනගේ දැනුම සුපෝෂණය කිරීම් වස් සහාය ලබා දී ඇති අතර තවද, 2018 වර්ෂය තුළදී අවශ්‍ය තාක්ෂණික අදාල පුහුණුව ලබා දීමෙන් විධායක කාර්ය මණ්ඩල සේවකයින්ගේ තාක්ෂණික නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා ආයතනය විසින් පියවර ගෙන තිබේ.

2018 වර්ෂය තුළදී කර්මාන්ත හා වෙළඳාම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සේවාවන් කාර්යක්ෂමව සඵලදායී ලෙස ලබාදීමෙන් ස්වයං පරියාප්ත තත්ත්වය පවත්වා ගැනීමට සමත්විය.

2018 වර්ෂය තුල උපයන ලද මුලු ආදායම LKR මිලියන 746.386 ක් වූ අතර 2017 දී LKR මිලියන 713.954 ක් විය.

මේ හේතුවෙන් LKR මිලියන 32.432 වැඩිවීමක් සිදු වී තිබේ. මෙම තත්ත්වය 2017 සිට 2018 වර්ෂය සඳහා එක් පුද්ගල ආදායම LKR මිලියන 2.1 සිට, LKR මිලියන 2.2 දක්වා වැඩි කර ගැනීමට හේතු විය.

වර්ෂයේ වැදගත් සිදුවීම් 2018

1. ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සියේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකා රජයේ අන්තර් ජාලය හරහා නොමිලේ වයි-ෆයි (wi-fi) ලබා දීමට ශ්‍රීලංප්‍රදා පියවර ගෙන තිබේ.

2. 2018 නොවැම්බර් සිට බලපැවැත්වෙන පරිදි ආනයනකරුවන් විසින් මාර්ගගතව දැනුම් දීම් ඉදිරිපත් කිරීම ඇතුලුව ආනයන පරීක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගගත පද්ධතිය සඳහා තත්ත්ව සහතික අංශය ආරම්භ කරන ලදී

3. ISO හි මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකාව සඳහා ජාතික ප්‍රමිතිකරණ ක්‍රමමෝපායක් (National Standardization Strategy) පිහිටුවීමට අදාළ කටයුතු ආරම්භ කරන ලදී.

4 මෙම අංශයේ තාක්ෂණික කාර්යමණ්ඩලය දකුණු ආසියානු කලාපීය ප්‍රමිතිකරණ සංවිධානයේ (SARSO) ආංශික තාක්ෂණික කමිටු විසින් සංවිධානය කරන ලද තාක්ෂණික රැස්වීම්වලට සහභාගී වීමෙන් සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස සේවය කිරීමෙන් එයට දායකත්වය ලබා දුන්හ.

5. SLS ISO 21101: 2017 යනු සංචාරක ව්‍යාපාර හා ඒ ආශ්‍රිත ප්‍රථම ප්‍රකාශිත ජාතික ප්‍රමිතියයි. ක්‍රියාකාරකම් අංශය තුල සිදුකරන ලද නියමු ව්‍යාපෘතියට සහභාගි විය. 2018 වර්ෂයේදී පාසිකුඩා හි අඛණ්ඩ දින 3 ක් තුල සිදුකරන ලද නියමු ව්‍යාපෘතියකට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිලධාරීන් සිවුදෙනෙකු සහභාගිවිය. මෙම වැඩසටහනේ පරමාර්ථය වූයේ ප්‍රමිතිය SLS ISO 21101:2017-වික්‍රමාන්විත සංචාරක (Adventure tourism) සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීමය. එය සංවිධානය කරනු ලැබුවේ ශ්‍රී ලංකා සංචාරක ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ මධ්‍යම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, (SLTDA) සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලය (PDO) සහයෙන්

6 ප්‍රමිතිකරණ අවශ්‍යතා පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා එක්සත් ජාතික කර්මාන්ත සංවර්ධන සංවිධානයේ (UNIDO) සහාය ඇතිය සැකසූ ආහාර හා කුළුබඩු අංශයේ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

7. හිසකෙස් හා රූපලාවන්‍ය සත්කාර කර්මාන්තය, නිෂ්පාදකයින් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ (IDB) හි සහාය ඇතිව දැනුවත් වීමේ වැඩසටහනක් පවත්වන ලදී.

වර්ෂයේ වැදගත් සිදුවීම් 2018

8 කොළඹ නගර කලාපයේ ආහාර සුරක්ෂිතතා (CRFS) ව්‍යාපෘතිය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් කොළඹ මහනගර සභාව සමග එක්ව සංවිධානය කරන ලද උපදේශක වැඩමුළු සහ රැස්වීම් සහ පසු විපරම් ප්‍රාදේශීය කණ්ඩායම් රැස්වීම් සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙන ලදී.

9. 2018 ජනවාරි 22 සිට 25 දක්වා ජාතික ප්‍රමිතිකරණ ක්‍රමෝපායමර්ග සකස් කිරීම පිළිබඳ ISO වැඩමුළුව පැවැත්විය.

.

10. රටේ විදුලි පරිභෝජනය අඩුකිරීමේ අරමුණින් ගෘහස්ථ යෙදීම්වල කාර්යක්ෂම විදුලි උපකරණ ප්‍රවර්ධනය අඛණ්ඩව කරගෙන යන ලදී. මේ සම්බන්ධව සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL) සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ ආලෝක විමේචක දියෝඩ (LED) සඳහා අවම බලශක්ති කාර්ය සාධනය සහතික කිරීම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

11. විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අනුබද්ධ විදාතා නිලධාරීන් සඳහා යහපත් පිළිවෙත් (GMP), විදාතා, නිෂ්පාදන SLS සහතිකකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර ඔහුන් යහපත් නිෂ්පාදන පිළිවෙත්/විදාතා, නිෂ්පාදන SLS සහතිකකරණ විගණකවරුන් ලෙස බඳවා ගැනීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

12. හරිතාගාර වායු විමෝචන (GHG) සත්‍යාපනය සහ FSSC 22000 සහතිකකරණය සඳහා නව සහතිකකිරීමේ ක්‍රම ස්ථාපිත කර ඇත

13. පද්ධති සහතිකකිරීමේ අංශයට අනුයුක්ත නිලධාරීන් කිහිපදෙනෙකු ISO තාක්ෂණික කමිටුවල සාමාජිකයින් සහ ජන්ද දායකයින් ලෙස සේවය කිරීමෙන් එම කමිටුල තාක්ෂණික යෙදවුම් ලබා දී ඇත

14. පාරිසරික කළමාකරණය පිළිබඳ ජාතික දර්පණ කමිටුවේ (National Mirror Committee) ලේකම් ලෙස අධ්‍යක්ෂ (පද්ධති සහතිකකිරීම) දිගටම කටයුතු කළාය.



ආදායම් උපයන ක්‍රියාකාරකම්

2001 වසරේදී හඳුන්වා දුන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනෙහි ආදායම් උත්පාදනය සඳහා වූ වැයම 2018 වර්ෂය තුළද අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර එය LKR මිලියන 746,386 ක ආදායමක් වාර්තා කළේය. මෙය අපේක්ෂිත ආදායම LKR මිලියන 79,136 ඉක්මවා ගොස් ඇති අතර ආදායම් මාර්ගයක් ලෙස රජයේ ප්‍රධානයක් මත යැපීම තුරන් කර ඇති අතර ස්වයං පරියාප්ත තත්වය පවත්වා ගැනීමට මග සලසයි.

ආයතනය විසින් උපයන ලද ආදායම (වර්ෂය සඳහා අයවැය ගත ආදායම LKR මිලියන 667,250 ට සාපේෂව LKR මිලියන 746,386 ක් විය) පහත සඳහන් ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයන්ගෙන් ලබාගෙන ඇත. සංසන්දනය කිරීම සඳහා 2017 වර්ෂය සඳහා සංඛ්‍යා සමග ඒවා පහත සටහනෙහි දක්වා ඇත.

Activity area	**2017 (LKR'000)**	**2018 (LKR'000)**
ආනයන පරීක්ෂණ ක්‍රියාකාරකම්	215,379	206,701
නිෂ්පාදන සහතිකකිරීම ධීවරණය,(fishery) පරීක්ෂාව සහ බෝතල් කළ පානීය ජලය ලියාපදිංචි කිරීම සඳහා ගාස්තු	202,948 191	190,901 ,794
පද්ධති සහතික කිරීමේ ක්‍රියාකාරකම්	67,729	80,992
රසායනාගාර පරීක්ෂණ සහ ක්‍රමාංකනය	171,855	201,286
සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්	38,229	47,497
ප්‍රමිති අලෙවිය සහ වෙනත් තොරතුරු සැපයීම	13,906	14,484
වෙනත්	3,707	3,711
	713,954	**746,386**

**ඉහත සියළු සංඛ්‍යා වලින් පොලී ආදායම බැහැර කර ඇත.)

පෙර වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම් යන දෙකම ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය භාණ්ඩාගාරයෙන් කිසිදු අරමුදලක් ලබා ගෙන නොමැත.

2018 වසර තුළ පුනරාවර්තන සහ මූලධන වැය සමග සංසන්දනාත්මක විස්කර පහත දැක්වේ.:

	2017 LKR මිලියන	2018 LKR මිලියන
පුනරාවර්තන වියදම්	LKR 670,979	LKR 674,848
මූලධන වියදම්	LKR 128,796	LKR 62,150

විද්‍යාත්මක ප්‍රමිති අංශය

ප්‍රමිති සම්පාදන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (ශ්‍රීලංප්‍රඅ) ප්‍රධාන අරමුණ වන්නේ ව්‍යුහයන්, වෙළඳ භාණ්ඩ, නිෂ්පාදිත, ද්‍රව්‍ය, පිළිවෙත් සහ මෙහෙයුම් සහ කළමනාකරණ පද්ධති සම්බන්ධ ජාත්‍යන්තර මාර්ගෝපදේශ මත පදනම්ව ජාතික ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රීලංප්‍රඅ විසින් කර්මාන්ත හා වාණිජ්‍යය තුළ ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කරයි. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව අනුව වරින් වර ප්‍රමිති සංශෝධනය කර ප්‍රතිශෝධනය කරනු ලැබේ. ශ්‍රීලංප්‍රඅ සහ තවත් බොහෝ ආයතන සහ රටේ උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් ප්‍රමිති ක්‍රියාත්මක කර ප්‍රවර්ධනය කරනු ලැබේ .

විද්‍යාත්මක ප්‍රමිතිකරණ අංශය විසින් පාරිභෝගිකයින්, නිෂ්පාදකයින්, පරිශීලකයින්, රාජ්‍ය ආයතන සහ ස්වාධීන තාක්ෂණික ආයතන නියෝජනය කරන සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ ස්වේච්ඡා මැදිහත්වීම සහ සහයෝගිත්වය සමඟ සහභාගීත්ව, විනිවිද පෙනෙන හා උපදේශන ක්‍රියාවලියක් හරහා ජාතික ප්‍රමිති සම්පාදනය කරනු ලැබේ. දැනට අංශය මගින් ජාතික ප්‍රමිති සම්පාදනය කිරීම සඳහා අනුගමනය කරන පිළිවෙත වන්නේ සීමිත සම්පත් කළමනාකරණය වන පරිදි යෝජනා අතරින් ප්‍රමුඛතා හඳුනා ගැනීමයි.



අංශය විසින් ආහාර, කෘෂිකර්මය, රසායනික, විලේපන, බහුඅවයවක, ඇසුරුම්, කඩදාසි, පුවරු, රෙදිපිළි හා ඇඳුම්, පාවහන්, සම් සහ සම් නිෂ්පාදන සහ කළමනාකරණ පද්ධති යන ක්ෂේත්‍ර සඳහා ජාතික ප්‍රමිති සම්පාදනය කරනු ලැබේ. මේ දක්වා ආයතනය විසින් ප්‍රමිති 3000 ක් පමණ ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රමිති පිරිවිතරයන්, පරීක්ෂණ ක්‍රම, භාවිත සංග්‍රහ, පාරිභාෂික පද මාලා සහ නියමයන්, සංකේත යනාදිය ලෙස වර්ග කළ හැකිය. මෙම අංශය ISO මාර්ගෝපදේශ අනුගමනය කරන අතර ප්‍රමිති සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන මහා මණ්ඩලය විසින් ආයතනයට උපදෙස් හා මග පෙන්වීම සඳහා ආහාර නිෂ්පාදන පිළිබඳ ආංශික කමිටුව, රසායනික හා බහුඅවයවක තාක්ෂණය (Polymer technology) පිළිබඳ ආංශික කමිටුව, කඩදාසි, පුවරු සහ ඇසුරුම් පිළිබඳ ආංශික කමිටුව, කෘෂිකර්ම පිළිබඳ ආංශික කමිටුව, රෙදිපිළි හා ඇඳුම් පිළිබඳ ආංශික කමිටුව, සම් සහ සම් නිෂ්පාදන පිළිබඳ ආංශික කමිටුව යනුවෙන් ආංශික කමිටු 06 ක් පත් කර ඇත.

ආංශික කමිටුවල මඟ පෙන්වීම ඇතිව මෙම අංශය ක්‍රියාකාරී කණ්ඩායම් (Working Groups) පත් කර සියලු තොරතුරු හා තාක්ෂණික දත්ත එක්රැස් කර අවශ්‍යතාවයන් / පරාමිතීන් තීරණය කිරීම පිණිස විශේෂඥ යින්ගේ සහාය උපරිමයෙන් සම්මුතියකට එළඹේ. අංශයේ නිලධාරීන් ක්‍රියාකාරී කණ්ඩායම් සහ ආංශික කමිටු සඳහා තාක්ෂණික ලේකම්වරුන් ලෙස සේවය කරති. කාර්යයක් වෙන් කළ පසු නිලධාරීන් සාහිත්‍ය සමීක්ෂණයක් සිදු කරයි. අදාළ ප්‍රමිතියේ මූලික කෙටුම්පත සහකාර අධ්‍යක්ෂවරුන් විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ (අංශ ප්‍රධානීන්ගේ) අධීක්ෂණය යටතේ සකස් කරනු ලැබේ. මූලික කෙටුම්පත (පළමු කෙටුම්පත) ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයන් අතර බෙදා හරිනු ලබන අතර වරින් වර සාමාජිකයින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේදී රැස්වී සාකච්ඡා කරනු ලැබේ.

ප්‍රමිති සම්පාදන ක්‍රියාවලියේ මහජන අදහස් දැක්වීමේ අවධියේදී ප්‍රමිති කෙටුම්පත් සඳහා මහජනතාවගෙන් අදහස් ලබා ගනී. එක් එක් කෙටුම්පත් ප්‍රමිතියට මහජන අදහස් දැක්වීමේ අවධිය සාමාන්‍යයෙන් මාස දෙකකි. මහජන අදහස් දැක්වීමේ කාල සීමාව තුළ ලැබුණු අදහස් ජාතික ආර්ථිකයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා මෙන්ම මහජනතාවගේ ආරක්ෂාව සැලසෙන පරිදි අවසාන කෙටුම්පත සකස් කිරීම සලකා බලනු ලැබේ .

WTO / TBT ගිවිසුම යටතේ, හැකි සෑම අවස්ථාවකදීම ජාතික ප්‍රමිතීන් ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම් කර ගැනීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. එබැවින් ජාතික ප්‍රමිතීන් සම්පාදනය කිරීමේදී ශ්‍රීලංප්‍රඅ ප්‍රතිපත්තිය වනුයේ හැකිතාක් දුරට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා භාවිතයන්ට අනුකූලවන පරිදි කටයුතු කිරීම වේ. ශ්‍රී ලංකා ප්‍රමිති සම්පාදනය කිරීමේදී ප්‍රකාශන නිමිකම් අවශ්‍යතාවයන්ට යටත්ව බොහෝ දුරට ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ප්‍රභව ලේඛන ලෙස භාවිතා කරයි. ශ්‍රී ලංකා ප්‍රමිති සම්පාදනය කිරීමේ අංශවලට ISO සහ IEC ප්‍රමිති ශ්‍රී ලංකා ප්‍රමිති ලෙස ප්‍රතිග්‍රහනය කිරීමට අයිතියක් ඇත. ඇතැම් අවස්ථාවල දී, අවශ්‍ය නම් වෙනස් කිරීම් වලට යටත්ව, SARSO, CODEX වැනි වෙනත් කලාපීය ප්‍රමිති සහ ජාත්‍යන්තර ප්‍රමිති ආයතන සමඟ ඔවුන්ගේ ප්‍රමිති ප්‍රතිග්‍රහනය කිරීම සඳහා ශ්‍රීලංප්‍රඅ (SLSI) ගිවිසුම් ඇති කර ගෙන තිබේ.

සියලුම සකස් කරන ලද ප්‍රමිති කෙටුම්පත් සහ ප්‍රතිග්‍රහනය කරන ලද ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ආංශික කමිටුවල අනුමැතියෙන් පසුව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන මහා මණ්ඩලයේ අවසාන අනුමැතියෙන් පසුව පමණි. සාමාන්‍යයෙන් මහා මණ්ඩල රැස්වීම් මසකට වරක් පවත්වනු ලැබේ. මුද්‍රිත ප්‍රමිතීන් ප්‍රලේඛන හා තොරතුරු අංශයෙන් (SLSI පුස්තකාලය) මිලදී ගත හැකිය. වැඩි විස්තර සඳහා සාමාන්‍ය ජනතාවට SLSI (www.slsi.lk) වෙබ් පිටුව බැලිය හැකිය.
අංශය විසින් නව ද්‍රව්‍ය සංවර්ධනය, තාක්ෂණය හෝ ක්‍රියාවලීන්හි දියුණුව හා ආර්ථිකයේ හා වෙළඳාමේ වෙනස්වීම් සමඟ එකෙල්ල කිරීම (align) සඳහා ප්‍රකාශිත ප්‍රමිතීන් සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සකස් කරනු ලැබේ. අඛණ්ඩ වැඩිදියුණුව පිණිස ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රමිතීන් සඳහා සංශෝධන නිකුත් කිරීම නැතහොත් ප්‍රමිති

ප්‍රතිශෝධනය කෙරේ. 2018 වර්ෂය තුළ නව ජාතික ප්‍රමිතීන් එකසිය දාහතක් (117) මෙම අංශය විසින් සකස් කරන ලද අතර මහා මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙය පසුගිය වසර දහය තුළ විශේෂ වාර්තාවක් වන අතර පළමු වරට මෙම අංශය නව ප්‍රමිතීන් සියයකට වඩා ප්‍රකාශයට පත් කර ඇත. මෙයින් හැට හතරක් (64) ජාත්‍යන්තර (ISO) ප්‍රමිතීන් වල නව ප්‍රතිග්‍රහන විය. ප්‍රමිති තිස් අටක් (38) ප්‍රතිශෝධනය කරන ලදී. මෙයින් විසිඅටක් (28) ප්‍රතිශෝධිත ජාත්‍යන්තර ප්‍රමිතීන් ප්‍රතිග්‍රහනය කිරීම් වේ. ප්‍රමිති හැට අටක් (68) සමාලෝචනය කරන ලදී. මහජන අදහස් දැක්වීමේ අදියර දක්වා තවත් ප්‍රමිතීන් හතළිහක් (40) පමණ ප්‍රගතියක් ලබා ඇත. සංශෝධන එකොළහක් (11) නිකුත් කර ඇති අතර ප්‍රමිති එකොළහක් (11) ඉවත් කර ගන්නා ලදී. ප්‍රමිති දහයක් (10) අභිභවනය කර තිබේ.

මෙය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් අසූ හයක් (86), ආංශික කමිටු රැස්වීම් දොළහක් (12) සහ අතිරේක විශේෂ රැස්වීම් දහයක් (10) සහ අදහස් එකතු කිරීම සඳහා අංශය විසින් සංවිධානය කරන ලද ජාතික දර්පණ කමිටු රැස්වීම් හයක (06) ප්‍රතිඵලයයි. අදාළ ටින් මාළු වල පරපෝෂිත ගැටළුව විසඳීම සඳහා මෙම වසරේදී විශේෂ රැස්වීමක් ද සංවිධානය කරන ලදී.

ISO 9001 හි අවශ්‍යතා අනුව මෙම අංශය ලේඛනගත තත්ත්ව කළමනාකරණ පද්ධතියක් (QMS) පවත්වාගෙන යයි. ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ, ආකෘති භාවිතා කර පවත්වා ගෙන යනු ලැබේ.

ජාත්‍යන්තර ප්‍රමිතිකරණ කටයුතු ISO (ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය)

බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයින් ISO තාක්ෂණික කමිටුවල සහභාගීත්ව හෝ නිරීක්ෂක සාමාජිකත්වය දරන අතර ISO ප්‍රමිති කෙටුම්පත් සඳහා ඡන්දය ප්‍රකාශ කිරී මෙන් සහ අදහස් දැක්වීමෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කිරීමට සහභාගී වේ. චීනයේ හැන්ගිට්‍රොන් හි පැවති 2018-10-23 සිට 2018-10-27 දක්වා ISO / TC 216 පූර්ණ රැස්වීමට සහ එහි ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්වලට එක් නිලධාරියෙක් සහභාගී විය.

කලාපීය ප්‍රමිතිකරණ කටයුතු SARSO (දකුණු ආසියානු කලාපීය ප්‍රමිතිකරණ සංවිධානය)

SARSO යනු කලාපයේ ප්‍රමිතිකරණය හා සුසංගත කිරීම පිළිබඳ කටයුතු කරන SAARC හි විශේෂිත ආයතනයකි. එහි ලේකම් කාර්යාලය බංග්ලාදේශයේ ඩකා - 1028 හි කාර්මික ප්‍රදේශයක් වන තේජ්ගා හි අංක 116 / A හි පිහිටා ඇත. ලේකම් කාර්යාලය අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් යුත් වෘත්තීය කාර්ය මණ්ඩලය සහ සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ. SARSO හි සාමාජික ආයතන වන්නේ SAARC රටවල් අටේ ජාතික ප්‍රමිති ආයතන (ජාප්‍රආ) වේ.

SARSO හි ආංශික තාක්ෂණික කමිටු විසින් සංවිධානය කරන ලද තාක්ෂණික රැස්වීම්වලට සහභාගී වීමෙන් සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස සේවය කිරීමෙන් මෙම අංශයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව සම්බන්ධ වේ. 2018 දී මෙම අංශයේ කාර්ය මණ්ඩලය විසින් ව්‍යාපෘති හැත්තෑ හතරක් (74) හසුරුවන ලදී.

ආහාර හා කෘෂිකර්මාන්තය, රසායනික ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන, රෙදිපිළි, ඇඟලුම් සහ සම් වලට අදාළ තාක්ෂණික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව පසුගිය වසරේදී සංග්‍රහකාරක ලෙස කටයුතු කරන ලදී. තාක්ෂණික කාර්ය මණ්ඩලය අනෙකුත් SAARC රටවල් මගින් පවත්වන ලද රැස්වීම්වලට ද සහභාගී විය. රසායනික හා රූපලාවණ්‍ය නිෂ්පාදන පිළිබඳ තුන්වන ආංශික කමිටු රැස්වීමට (දින 02) නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වූ අතර තවත් නිලධාරීන් දෙදෙනෙකු පාකිස්තානයේ පැවති ආහාර හා කෘෂිකර්ම පිළිබඳ හත්වන තාක්ෂණික කමිටු රැස්වීමට (දින 02) සහභාගී වූහ.

ප්‍රමිති ප්‍රවර්ධන / දැනුවත් කිරීමේ වැඩසටහන් / සම්මන්ත්‍රණ

ප්‍රමිතිකරණ අවශ්‍යතා පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා සැකසූ ආහාර හා කුළුබඩු
අංශයේ පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන UNIDO සංවිධානයේ සහාය ඇතිව පවත්වන ලදී. වාරියපොලදී පවත්වන ලද යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) පිළිබඳ දැනුවත් වීමේ වැඩ සටහනට සහ පාසැල් ලමුන් සඳහා වැඩ සටහනට දායකත්වය ලබා දෙන ලදී. විද්‍යාත්මක තාක්ෂණික සායන වැඩසටහනට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) 2017 වසරේදී සංචාරක හා ආශ්‍රිත ක්‍රියාකාරකම් අංශයේ පළමු ප්‍රමිතිය ප්‍රකාශයට පත් කළේය (SLS ISO 21101: 2017 වික්‍රමාන්විත සංචාරක - ආරක්ෂක කළමනාකරණ පද්ධති අවශ්‍යතා). ප්‍රතිග්‍රහනය (adoption) කරන ලද මෙම ප්‍රමිතිය ප්‍රවර්ධනය කිරීම පිණිස 2018 දී දින 3 ක් තුළ නියමු ව්‍යාපෘතියක් පාසිකුඩා හිදී පවත්වන ලදී. මේ සඳහා නිලධාරීන් හතර දෙනෙක් සහභාගි වූහ. මෙය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සංවර්ධන කාර්යාලයේ මධ්‍යම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපත්ති සම්පාදන ඒකකයේ (PDO) සහාය ඇතිව ශ්‍රී ලංප්‍රඅා විසින් සංවිධානය කරන ලදී. කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) සහාය ඇතිව නිෂ්පාදකයින් අතර හිසකෙස් හා රූපලාවණ්‍ය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන ලදී.

UNIDO ව්‍යාපෘති - කුළුබඩු සහ සැකසූ ආහාර -

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සඳහා සංවිධානය කර ඇති රැස්වීම් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වලට සක්‍රිය දායකත්වය ලබා දෙන ලදී. FAO ව්‍යාපෘතිය - කොළඹ, නගර කලාපයේ ආහාර සුරක්ෂිතතා (CRFS) ව්‍යාපෘතිය - එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් කොළඹ මහ නගර සභාව (CMC) සහ ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සමඟ එක්ව සංවිධානය කරන ලද උපදේශන වැඩමුළු සහ රැස්වීම් සහ පසු විපරම් නාගරික කෘෂිකාර්මික රැස්වීම් සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙන ලදී.

වෙනත් අංශවලට සේවා

SLSI හි අනෙකුත් අංශවලට සහාය වීම සඳහා කාර්ය මණ්ඩලය සම්පත්දායකයින්, විගණකවරුන්, ඇගයීම් කරුවන් යනාදී වශයෙන් සේවය කළහ. ISO 9001, ISO 22000, ISO 14001, OHSAS හි විගණන සුදුසුකම් ඇති සහ GMP පිළිබඳ දැනුම හා පළපුරුද්ද ඇති කාර්ය මණ්ඩලය විසින් පද්ධති සහතිකකරණ අංශය සහ නිෂ්පාදන සහතිකකරණ අංශය විසින් සංවිධානය කරන ලද විගණන සඳහා මිනිස් දින 200 ක් වැය කරන ලදී. තත්ත්ව ආරක්ෂණ අංශයේ ආනයන පරීක්ෂණ ක්‍රමය යටතේ ටින් මාළු නියැදි සංවේදක ඇගයීම සඳහා ඇගයීම් කරුවන් ලෙස සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින් සේවය කළ අතර නියැදි 60 ක් ඇගයීමට ලක්කරන ලදී. පුහුණු අංශය සඳහා සම්පත්දායකයින් ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පැය 50 ක දේශන පවත්වන ලදී. රැස්වීම්, අනෙකුත් අංශ විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන සහ සේවාවන් සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් සහභාගී වූහ. 2018 වර්ෂයේ අවස්ථා දෙකකදී ජාතික තත්ත්ව සම්මාන වැඩසටහන සඳහා සංවිධාන ඇගයීමේදී ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරීන් විසින් සේවය ලබා දෙන ලදී.

බාහිර ආයතන සඳහා සේවාවන්

අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ශ්‍රී ලංකා යුද හමුදා විශේෂ කාර්ය සාධක බලකාය, ශ්‍රී ලංකා පොලිසිය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික කෝඩෙක්ස් කමිටුව, තාක්ෂණික උපදේශක කමිටු, , රූපලාවණ්‍ය උපකරණ සහ ඖෂධ නියාමන අධිකාරිය, ජාතික පොහොර ලේකම් කාර්යාලය, කුළුබඩු මණ්ඩලය මෙන්ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, බලධාරීන් යනාදිය සඳහා දැනුම බෙදා හැරීම පිණිස උපදේශක කමිටු, විවිධ රැස්වීම් සඳහා සක්‍රියව වසර පුරා සහභාගී වීමෙන් මෙම අංශයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සේවය ලබා දුන්හ. උපදේශක කමිටුව හරහා අපනයන සංවර්ධන මණ්ඩලයට (EDB) සහ ශ්‍රී ලංකාවේ ජාතික අපනයන ක්‍රමෝපායේ (National export strategy) විශේෂ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල කිහිපයක සේවය කළ අතර අපනයන හා වෙළඳ ආශ්‍රිත රැස්වීම්වලට ද සහභාගි වූහ. නීතියේ විධිවිධානවලට අනුව දේශීය හා ආනයනික ආලේපන ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන අයදුම්පත් නියාමනය / ඇගයීම සඳහා ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය (NMRA) සමඟ එකට කටයුතු කරන ලදී.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ හා වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද TBT සහ SPS පිළිබඳ ජාතික උප කමිටුවල සාමාජිකයින් ලෙස සහභාගී වූ අතර වෙළඳ ගිවිසුම් පිළිබඳ ලේඛන සමාලෝචනය සඳහා දායක විය. දැනුම ලබා දීමෙන් ප්‍රමිතිකරණ අනුකූලතා ඇගයීම් සහ වෙළඳාම යන ක්ෂේත්‍රයන්හි රුසියාව, සිංගප්පූරුව, තුර්කිය වැනි රටවල් සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් කෙටුම්පත් කිරීමට සම්බන්ධ වූ අතර වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ප්‍රමිතිකරණය සහ වෙළඳාමට අදාළ රැස්වීම්වලට සහභාගි වූහ.

කාර්ය මණ්ඩලයේ නිපුණතා සංවර්ධනය (විදේශීය පුහුණුව / විගණන)

එක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් (SDD) 2018 දී තායිලන්තයේ දින 05 ක යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) පිළිබඳ අධ්‍යයන චාරිකාවකට සහභාගි විය. 2018-08-13 සිට 2018-08-16 දක්වා දින 04 ක් ඉන්දුනීසියාවේ පැවැත්වුන ජාතික ප්‍රමිති සම්පාදන ව්‍යාපෘති සහ වැඩ සටහන පිළිබඳ කලාපීය පුහුණුව සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් සහභාගි වූ අතර ISO 2018-09-17 සිට 2018-09-19 දක්වා දින 03 ක් තුළ චීනයේ පැවති 2 වන චීන-දකුණු ආසියානු ප්‍රමිතිකරණ සහයෝගීතා සමුළුවට ද සහභාගී විය. ඉන්දියාවේ (දින 05) පැවති UTZ / AA නව අනුවාදය සහ නිරත වීමේ (new version and engagement) සැසිය සඳහා සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු (තාක්ෂණික) සහභාගී වූහ. ඉන්දියාවේ ග්ලෝබල් හෙල්ත් කෙයාර් ප්‍රොඩක්ට්ස් හි නිෂ්පාදන සහතික කිරීමේ විගණනය නිලධාරියෙකු විසින් සිදු කරන ලදී (දින 05). ඉන්දියාවේ පැවති ICTA 10 වන වටයේදී SPS සහ TBT සම්බන්ධ සාකච්ඡා සඳහා අධ්‍යක්ෂවරයා සහභාගී විය. ශ්‍රී ලංප්‍රෝ හි පුහුණු අංශය විසින් 2018 දෙසැම්බර් 17 සිට 18 දක්වා පවත්වන ලද ISO 9001 ප්‍රධාන විගණක දේශීය පුහුණු වැඩසටහනට එක් සහකාර අධ්‍යක්ෂවරයෙක් සහභාගී විය.

ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය

තොරතුරු තාක්ෂණය, විදුලි උපකරණ සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කිරීම් සහ වැඩමුළු ක්‍රියාකාරකම් ඇතුළු සියලුම ඉංජිනේරු විෂයයන් සඳහා ජාතික ප්‍රමිති සකස් කිරීම හා යාවත්කාලීන කිරීම ඉංජිනේරු ප්‍රමිතිකරණ අංශය සතු වගකීමවේ.

සමාලෝචිත වර්ෂය තුළ නව ශ්‍රී ලංකා ප්‍රමිති විසි දෙකක් (22) සම්පාදනය කරන ලද අතර, ප්‍රමිති පහක් (05) සංශෝධනය කර ජාතික ප්‍රමිති ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන් දහඅට (18) ක් කරන ලදී. පවත්නා ප්‍රමිතීන්ට සංශෝධන දෙකක් (02) නිකුත් කරන ලදී. මෙම ප්‍රමිතීන් සකස් කිරීම සඳහා ආංශික කමිටු රැස්වීම් 23 ක් සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් තිස් දෙකක් (32) පවත්වන ලදී. ඉංජිනේරු අංශය අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ අඛණ්ඩව කටයුතු කළ අතර ප්‍රමිති සම්පාදනය සඳහා වූ තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම්වලට සහභාගී විය.

නිෂ්පාදන සහනික කිරීමේ ක්‍රියාකාරකම් සඳහා විගණකවරුන් ලෙස සහභාගී වීමෙන් (SLS) නිෂ්පාදන සහනික කිරීමේ ක්‍රියාකාරකම් සඳහා මෙම අංශයේ ඉංජිනේරුවන් දායක විය.

ගෘහස්ථ යෙදීම්වල බලශක්ති කාර්යක්ෂම විදුලි උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂමතා ලේබල් කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. සංයුක්ත ප්‍රතිදීප්ත ලාම්පු (CFL) සඳහා නව සහනික හතලිස් එකක් (41) සහ නැවත සහනික කිරීම් විස්සක් (20) ඇතුළුව බලශක්ති කාර්යක්ෂමතා සහනික හැට එකක් (61) නිකුත් කරන ලදී. ආලෝක විමෝචක දියෝඩ (LED) සඳහා අවම බලශක්ති කාර්ය සාධන සහනික තිස් එකක් (31) නිකුත් කරන ලදී.

ඇ) වෙනත් සංවිධාන සමඟ සිදුකළ ප්‍රමිති සම්පාදන කටයුතු

පහත දැක්වෙන ප්‍රමිති සම්පාදනය කිරීම එහි දක්වා ඇති ආයතනවල සහාය ඇතිව අඛණ්ඩව සිදු කරන ලදී:

1. ශ්‍රී ලංකාවේ නිරසාර බලශක්ති අධිකාරිය සමඟ විදුලි උපකරණ සඳහා බලශක්ති කාර්යක්ෂමතා ශ්‍රේණිගත කිරීමේ ප්‍රමිතීන්.

2. ශ්‍රී ලංකාවේ නිරසාර බලශක්ති අධිකාරිය සමඟ LED සඳහා අවම බලශක්ති කාර්ය සාධන ක්‍රමයක් (MEPS) ක්‍රියාත්මක කිරීම

3. පුද්ගල අවශ්‍යතා සංවිධානයේ (People in Need Organization) සහභාගිත්වය ඇතිව ගෘහස්ථ ජීව වායු පද්ධතිය සඳහාවූ භාවිත සංග්‍රහය ප්‍රතිශෝධනය කිරීම

ඉහත ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව, මෙම අංශය බාහිර ආයතන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අනෙකුත් අංශ සඳහා උපදේශන සේවා සපයන ලදී. ශ්‍රී ලං ප්‍ර ආ ඇතුළු රාජ්‍ය ආයතනවල රජයේ ටෙන්ඩර් ක්‍රියාවලියට සහාය වීම සඳහා මෙම අංශයේ ඉංජිනේරුවන් තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සහ ප්‍රසම්පාදන කමිටුවේ (PC) සේවය කළහ.

ශ්‍රී ලං ප්‍ර ආ විසින් පවත්වනු ලබන පුනුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස මෙම අංශයේ ඉංජිනේරුවන් කටයුතු කළ අතර තත්ත්ව කළමනාකරණ පද්ධතිය (ISO 9001), පාරිසරික කළමනාකරණ පද්ධතිය (ISO 14001), වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (OHSAS 18001), බලශක්ති කළමනාකරණය (ISO 50001) සඳහා විගණකවරුන් ලෙස සහ ජාතික තත්ත්ව සම්මාන උළෙල සඳහා ඇගයීම්කරුවන් ලෙසද සහභාගී වූහ.

ආ) ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

සමාලෝචිත වර්ෂය තුළදී, අංශය විසින් වැඩමුළුව ඇතුළු වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා සහ ඉදිකිරීම් කටයුතු සඳහා අංශයේ ඉංජිනේරුවන්ගේ සහාය ඇතිව අඛණ්ඩව සේවාවන් සපයන ලදී.

ඇ) වාහන නඩත්තු කිරීම

අංශය විසින් වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

තත්ත්ව ආරක්ෂණ අංශය

මෙම අංශය මගින්, කර්මාන්තය සහ වෙළඳාම විසින් ආනයනික නිෂ්පාදන සහ අපනයනය සඳහාවූ නිෂ්පාදනවල ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම සඳහා වැදගත් ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබේ. නිසි පාලනයන් සහ වඩා හොඳ ප්‍රති .ල සහතික කිරීම සඳහා වර්ෂය තුළ මෙම යෝජනා ක්‍රම තවදුරටත් ශක්තිමත් කරන ලදී.

ක්‍රියාත්මක වන ක්‍රම

අ. ආනයන පරීක්ෂාව

මේ වන විට මෙම ක්‍රමය යටතේ අධීක්ෂණය කරනු ලබන මුළු අයිතම සංඛ්‍යාව 123 කි.



ආනයන පරීක්ෂා ක්‍රමයේ මාර්ගගතව (on-line) දැනුම් දීම් සහ මාර්ගගතව ක්‍රියාත්මක කිරීම් 2018 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලදී.

වර්ෂය තුළ තොග 19305 ක් නිරීක්ෂණය කරන ලද අතර තොග 10301 කින් නියැදි ලබා ගන්නා ලදී. වර්ෂය තුළ මෙම ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුළු ආදායම LKR මිලියන 193 ක ඉලක්කයට සාපේක්ෂව LKR මිලියන 208 කි.

ක්‍රමයේ සඵලතාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස 2018 වර්ෂය තුළ නිෂ්පාදන / රසායනාගාර ලියාපදිංචි කිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර ආනයන පරීක්ෂා ක්‍රමය යටතේ නිෂ්පාදන 50 ක් ලියාපදිංචි කර ඇත.

ආ. කජු මද වල පූර්ව අපනයන තත්ත්ව සහතික කිරීම

මෙම ක්‍රමය කජු මද සඳහා ස්වේච්ඡා පදනමක් මත ක්‍රියාත්මක විය. වර්තමාන ක්‍රමය යටතේ 2018 වර්ෂය තුළ ඉල්ලීම් නොලැබුණු බැවින් 2018 දී කජු තොග පරීක්ෂා කිරීම සිදු නොවීය.

අංශයේ සමස්ත ආදායම

2018 වර්ෂය සඳහා ශ්‍රී ලං ප්‍ර ආ හි ඉලක්කගත ආදායමෙන් 29% ක ධනාත්මක විචල්‍යතාවයක් ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන දායකත්වය වූ LKR 193 මිලියන ඉලක්කයට සාපේක්ෂව මෙම අංශය මගින් LKR මිලියන 208 ක සමස්ත ආදායමක් වාර්තා කළේය.

පද්ධති සහතිකකරණ අංශය

ශ්‍රී ලං ප්‍ර ආ හි පද්ධති සහතිකකරණ අංශය මගින් දැනට පහත දැක්වෙන කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රම 12 ක් ක්‍රියාත්මක කරයි.

- ISO 9001 තත්ත්ව කළමනාකරණ පද්ධතිය,
- ISO 14001 පාරිසරික කළමනාකරණ පද්ධතිය,
- ISO 22000 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය,
- HACCP උපද්‍රව විශ්ලේෂක අවදානම් පාලක ලක්ෂ්‍ය සහතිකකරණ ක්‍රමය,
- OHSAS 18001 වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය,
- GMP යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතික කිරීමේ ක්‍රමය,
- සුපිරි වෙළඳපොල සහතික කිරීමේ ක්‍රමය,
- ඓන්ද්‍රීය ද්‍රව්‍ය සහතික කිරීමේ (Organic certification) ක්‍රමය,
- ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධතිය,
- ආහාර සහ පාන සඳහා නිර්මාංශ පද්ධති සහතික කිරීමේ ක්‍රමය,
- විදානා පද්ධති සහතික කිරීමේ ක්‍රමය
- හරිතාගාර වායු සත්‍යාපනය සහ ප්‍රමාණකරණය

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) සහ RvA නෙදර්ලන්තය මගින් QMS, FSMS, සහ HACCP සහ EMS සඳහා ලත් ප්‍රතීතන තත්ත්වය පවත්වා ගැනීමට පද්ධති සහතිකකරණ අංශයට හැකි විය.

ISO 9001: 2008 / ISO 9001: 2015 තත්ත්ව පද්ධති සහතිකකරණ ක්‍රමය

2018 වර්ෂය තුළ ISO 9001 සහතික කිරීම සඳහා අයදුම්පත් 56 ක් ලැබුණු අතර, ප්‍රමාණවත් විගණන 56 ක්, අදියර 1 විගණන 46 ක්, අදියර 2 විගණන 30 ක්, පසු විපරම් විගණන 131 ක් සහ නැවත ඇගයීම් 148 ක් සිදු කර ඇත. 2018 වර්ෂය තුළ නව සහතික 53 ක් නිකුත් කරන ලදී.

විගණකවරුන් දෙදෙනෙකු ප්‍රධාන විගණක තත්වයට සහ එක් නිරීක්ෂකයෙකු විගණක තත්වයට උසස් කිරීම මගින් තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් සවිමත් කරන ලදී. RvA ප්‍රතීතනය යටතේ විෂය පථ 19 ක් පවත්වා ගැනීමට හැකි විය.

2018 වර්ෂය තුළ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු ඇතුළු විවිධ ආයතනවල ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ සංවිධාන සහතික කිරීමට ශ්‍රී ලං ප්‍ර ආ ට හැකි විය.

RvA සහ SLAB යන ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් විගණනයන් සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙනිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන ඇතුළත් විය. සාක්ෂි දැරූ විගණනය(Witness audit) ISO 9001: 2015 නව ප්‍රමිතිය මත පදනම් විය.

RVA සහ SLAB විසින් ISO / IEC 17021: 1 වන කොටස: 2015 ට අනුකූලව වසරක කාලයක් සඳහා ශ්‍රී ලං ප්‍ර ආ ට ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වාගෙන යාම සඳහා නිර්දේශ කරන ලදී.

ISO 14001: 2004 / ISO 14001: 2015 පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය

ISO 14001 ක්‍රමය යටතේ අයදුම්පත් 28 ක් ලැබුණු අතර, ප්‍රමාණවත් විගණන 28 ක්, අදියර 1 විගණන 22 ක්, අදියර 2 විගණන 22 ක්, පසුවිපරම් විගණන 32 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 44 ක් සිදු කර ඇති අතර 2018 වර්ෂය තුළ නව සහතික 32 ක් නිකුත් කර ඇත.

එක් විගණකවරයෙකු ප්‍රධාන විගණක තත්වයටත්, එක් නිරීක්ෂකයෙකු විගණක තත්ත්වයටත් උසස් කිරීම මගින් පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් සවිමත් කරන ලදී.

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) සහ RvA නෙදර්ලන්තයෙන් QMS, FSMS, සහ HACCP සහ EMS සඳහා ප්‍රතීතනය ලත් තත්ත්වයක් පවත්වා ගැනීමට පද්ධති සහතික කිරීමේ අංශයට හැකි විය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අයදුම්පත් 30 ක් ලැබී ඇත. ප්‍රමාණවත් විගණන 30 ක්, අදියර 1 විගණන 22 ක්, අදියර 2 විගණන 20 ක් සහ නිරීක්ෂණ විගණන 78 ක් සහ නැවත ඇගයීම් විගණන 52 ක් සිදු කරන ලදී. නව සහතික 22 ක් නිකුත් කරන ලදී.

එක් විගණකවරයෙකු ප්‍රධාන විගණන තත්වයටත්, එක් නිරීක්ෂකයෙකු විගණන තත්ත්වයටත් උසස් කිරීම මගින් ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතික කිරීමේ යෝජනා ක්‍රමය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

RvA සහ SLAB යන ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් විගණනයන් සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන ඇතුළත් විය. සාක්ෂිකරුවන්ගේ විගණනය ISO 22000 ප්‍රමිතිය මත පදනම් විය.

RVA සහ SLAB විසින් ISO / IEC 17021: 1 වන කොටස: 2015 ට අනුකූලව වසරක කාලයක් සඳහා ශ්‍රී ලං ප්‍ර ආ ට ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වාගෙන යාම සඳහා නිර්දේශ කරන ලදී.

HACCP ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය

සමාලෝචිත වර්ෂය තුළ අයදුම්පත් 19 ක් ලැබී ඇත. ප්‍රමාණවත් විගණන 19 ක්, අදියර 1 විගණන 22 ක්, අදියර 2 විගණන 20 ක් සහ පසුවිපරම් විගණන 89 ක් සහ නැවත ඇගයීම් විගණන 55 ක් සිදු කර ඇති අතර නව සහතික 17 ක් නිකුත් කරන ලදී.

එක් විගණකවරයෙකු ප්‍රධාන විගණක තත්වයටත් එක් නිරීක්ෂකයෙකු විගණක තත්ත්වයටත් උසස් කිරීම මගින් HACCP ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය තවදුරටත් සවිමත් කරන ලදී.

RvA සහ SLAB යන ප්‍රතීතන ආයතන දෙකම ඒකාබද්ධ පසුවිපරම් විගණනයන් සිදු කරන ලදී. ප්‍රතීතන විගණන දෙකෙහිම විෂය පථය යටතේ කාර්යාල ඇගයීම සහ සාක්ෂි දැරූ විගණන ඇතුළත් විය. සාක්ෂිකරුවන්ගේ විගණනය ISO 14001: 2015 නව ප්‍රමිති පිටපත මත පදනම් විය.

RVA සහ SLAB විසින් ISO / IEC 17021: 1 වන කොටස: 2015 ට අනුකූලව වසරක කාලයක් සඳහා ශ්‍රී ලං ප්‍ර ආ ට ප්‍රතීතන තත්ත්වය දිගටම පවත්වාගෙන යාම සඳහා නිර්දේශ කරන ලදී.

OHSAS සහතිකකරණ ක්‍රමය

මෙම සහතිකය යටතේ 2018 වර්ෂය තුළ අයදුම්පත් 8 ක් ලැබී ඇති අතර ප්‍රමාණවත් විගණන 08 ක්, අදියර 1 විගණන 17 ක්, අදියර 2 විගණන 7 ක් සහ පසුවිපරම් විගණන 31 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 10 ක් සිදු කරන ලදී. 2018 වර්ෂය තුළ නව සමාගම් 11 ක් සහතික කරන ලදී.

GMP - යහපත් නිෂ්පාදන පිළිවෙත් ක්‍රමය

වර්ෂය තුළ අයදුම්පත් 188 ක් ලැබී ඇති අතර ප්‍රමාණවත් විගණන 188 ක්, අදියර 1 විගණන 92 ක්, අදියර 2 විගණන 32 ක්, පසුවිපරම් විගණන 61 ක් සහ නැවත සහතික කිරීමේ විගණන 53 ක් සිදු කරන ලදී. නව සහතික 65 ක් නිකුත් කරන ලදී.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර යහපත් නිෂ්පාදන පිළිවෙත් ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා පද්ධති සහතික කිරීමේ අංශය විවිධ දිස්ත්‍රික්කවල පාරිභෝගික කටයුතු අධිකාරියේ සහයෝගයෙන් ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල GMP ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ සහාය ඇතිව ආරම්භ කරන ලද GMP සහතික කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කෙරිණි.

සුපිරි වෙළඳපොල සහතිකකරණ ක්‍රමය

සුපිරි වෙළඳසැල් සහතිකකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර ගත් අතර කීල්ස් සුපිරි වෙළඳ අලෙවිසැල් 99 ක් සහතික කරන ලදී. අදියර 1 විගණන 12 ක්, අදියර 2 විගණන 7 ක්, පසුවිපරම් විගණන 35 ක් සිදු කරන ලදී. නව සහතික 22 ක් නිකුත් කරන ලදී.

ඵෙන්ද්‍රීය ද්‍රව්‍ය සහතිකකරණ ක්‍රමය

2 අදියර 1 විගණනය සහ 0 අදියර 2 විගණනය සිදු කරන ලද අතර එක් නව සහතිකයක් නිකුත් කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පද්ධති සහතික කිරීමේ අංශයේ නිලධාරීන් සහභාගී විය.

බලශක්ති කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රමය

සමාලෝචනය සඳහා අයදුම්පත් දෙකක් ලැබුණි. ප්‍රමාණවත් විගණන 02 ක්, 1 අදියර විගණන 02 ක්,, අදියර 2 විගණන 01 ක් සහ පසුවිපරම් විගණන 05 ක් සිදු කරන ලදී. නව සහතික 03 ක් නිකුත් කරන ලදී.

නිර්මාංශ ආහාර සහ පාන පද්ධති සහතිකකරණය

සමාලෝචනය සඳහා එක් අයදුම්පතක් ලැබුණි. ප්‍රමාණවත් විගණන 01 ක්, 1 අදියර විගණන 01 ක් සිදු කරන ලදී.

විදාතා පද්ධති සහතික කිරීමේ යෝජනා ක්‍රමය

සමාලෝචනය සඳහා එක් අයදුම්පතක් ලැබුණි

හරිතාගාර වායු සත්‍යාපනය සහ ප්‍රමාණනය

සත්‍යාපනය සඳහා අයදුම්පත් දෙකක් ලැබුණි. ප්‍රමාණවත් විගණන 02 ක්, 1 අදියර විගණන 02 ක්, 2 අදියර විගණන 02 ක් සිදු කරන ලද අතර සත්‍යාපන සහතික 02 ක් නිකුත් කරන ලදී.

ආදායම

2018 වර්ෂය තුළ පද්ධති සහතිකකරණ අංශය LKR 87 980 681 ක් ඉලක්ක කළ LKR 70,000,000.00 ට සාපේක්ෂව උපයා ඇත.

වෙනත් ක්‍රියාකාරකම්

1. හරිතාගාර වායු විමෝචන (GHG) සත්‍යාපනය සඳහා නව සහතික කිරීමේ ක්‍රමයක් ස්ථාපිත කර ඇත.
2. FSSC 22000 සහතිකකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.
3. කළමනාකරණ පද්ධති විගණකවරුන් දැනුවත් කිරීම සඳහා පද්ධති සහතිකකරණ අංශය විවිධ මාතෘකා පිළිබඳ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත.
4. අංශයට අනුයුක්ත නිලධාරීන් නිෂ්පාදන සහතික කිරීමේ අංශය, තත්ත්ව ආරක්ෂණ අංශය (QA), පුහුණු අංශය, ප්‍රමිතිකරණ අංශය සහ අලෙවි අංශය වෙත සිය සේවාවන් ලබා දී ඇත.
5. පද්ධති සහතික කිරීමේ අංශයට අනුයුක්ත නිලධාරීන් කිහිප දෙනෙකු සාමාජිකයින් සහ ඡන්ද දායකයින් ලෙස සේවය කිරීමෙන් ISO තාක්ෂණික කමිටුවලට තාක්ෂණික යෙදවුම් ලබා දී ඇත.
6. පාරිසරික කළමනාකරණය පිළිබඳ ජාතික දර්පණ කමිටුවේ ලේකම් ලෙස අධ්‍යක්ෂ (පද්ධති සහතිකකරණ) අඛණ්ඩව කටයුතු කරනු ලැබේ
7. සහතිකකරණ අංශයේ අධ්‍යක්ෂක සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රටේ සාර්ථකත්වය සඳහා අමාත්‍යාංශවල උපදේශක කමිටු කිහිපයකට සහභාගී වී ඔවුන්ගේ වටිනා දායකත්වය ලබා දුන්හ.

කර්මාන්ත / සේවාවන් සඳහා පුහුණුව ලබා දීම

ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරඟ කිරීම සඳහා උසස් තත්ත්වයේ නිෂ්පාදන / සේවා නිපදවීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීමේ අරමුණින් කර්මාන්තයේ නියුතු පුද්ගලයින්, පෞද්ගලික / රාජ්‍ය අංශයේ ආයතන සහ පුද්ගලයින් සඳහා ප්‍රමිතිකරණය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ පුහුණුව ආයතනය විසින් සපයයි. SLSI මගින් ප්‍රමිතිකරණය, ISO 9001 තත්ත්ව කළමනාකරණ පද්ධති, ISO 14001 පාරිසරික කළමනාකරණ පද්ධති, ISO 22000 ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති, ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධති, OHSAS වෘත්තීය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති, ගුණාත්මකභාවය හා සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු වැඩසටහන් සියලුම ශ්‍රේණිවල සේවකයින් සඳහා එනම් ඉහළ කළමනාකරණය, මධ්‍යම කළමනාකරණය, විධායකයින්, අධීක්ෂකවරුන්, කාර්මික ශිල්පීන් සහ වැඩබිම සේවකයින් සඳහා පවත්වනු ලැබේ. ඉල්ලීම පරිදි මෙම වැඩසටහන් සේවාදායක පරිශ්‍රයන්හි ද පවත්වනු ලැබේ. 2018 වර්ෂය තුළ ශ්‍රීලංප්‍රඅ විසින් වැඩසටහන් අසූ අටක් (88) පවත්වන ලද අතර පුද්ගලයින් දෙදහස් හැට නවයක් (2069) පුහුණු කරන ලදී. ගෘහස්ථ පුහුණුවීම් (in-house training) පනස් තුනක් (53) පවත්වන ලද අතර එක්දහස් හත්සිය හයක් (1706) ක් ද පුහුණු කරන ලදී. ඉහත විෂයයන් පිළිබඳ සේවකයින් හැත්තෑ පහක් (75) සඳහා පුහුණුව ලබා දෙන ලදී.



2018 වර්ෂය තුළ කළමනාකරණ පද්ධති පිළිබඳ සහතික පාඨමාලාවක්, සිග්මා හය (Six sigma) පිළිබඳ පුහුණු වැඩසටහනක් සහ ජීවන චක්‍රය පිළිබඳ යථා දර්ශය(perspective) සහ පාරිසරික කළමනාකරණ පද්ධතිවල පාරිසරික පාරිසරික ගැටළු සහ එහි බලපෑම් ඇගයීම සහ නෛතික අවශ්‍යතා පිළිබඳ පුහුණු වැඩසටහන යනුවෙන් නව පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී. කර්මාන්ත / සේවා සංවිධානවල සාමාජිකයින් සහ මෙම ක්ෂේත්‍රයන්හි වාහක සංවර්ධනය අපේක්ෂා කරන පුද්ගලයින් සඳහා තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා 3 ක් සහ ආහාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් වසර පුරා පවත්වන ලදී. තත්ත්ව කළමනාකරණ ඩිප්ලෝමා තුන සඳහා එකසිය අසූ තුනක් (183) සහ ආහාර තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහනට හතළිස් තුනක් (43) සහභාගී වූහ.



2018 දී තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා අටක් පවත්වන ලද අතර මෙම වැඩසටහන් මගින් තුන්සිය විසිඑක් (321) ක් පුහුණු කරන ලදී. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන, කළමනාකරණ පද්ධති පිළිබඳ පුහුණු වැඩසටහන - මොරටුව විශ්ව විද්‍යාලය, තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පාඨමාලාව (දින 05) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා ද විශේෂ වැඩසටහන් තුනක් පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා එකසිය පනස් අටක් (158) සහභාගී වූහ.

2018 වර්ෂයේදී පුහුණු ක්‍රියාකාරකම් තුළින් උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 47.44 කි.

මුද්‍රණ ඒකකය

2018 වර්ෂය තුළ ප්‍රමිති විසිනවයක් (29) මුද්‍රණය කර ඇති අතර පුහුණු වැඩසටහන්, විභාග ප්‍රශ්න පත්‍ර, ගුණාත්මක පද්ධති ලේඛන, ප්‍රමිති පිළිබඳ ප්‍රවර්ධන ද්‍රව්‍ය, ප්‍රචාරක ද්‍රව්‍ය, දත්ත පත්‍රිකා යනාදිය ඇතුළත් අත් පත්‍රිකා (hand-outs) 550,000 කට වැඩි ප්‍රමාණයක් මුද්‍රණය කර ඇත.

අලෙවි හා ප්‍රවර්ධන අංශය

ඉලක්කය	ක්‍රියාකාරකම් / උප ක්‍රියාකාරකම්	2018 සඳහා ඉලක්කය	2018 දී සාධනය
